# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,349 - 2023 සැප්තැම්බර් මස 08 වැනි සිකුරාදා - 2023.09.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 910 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 910 |


*සැ. යු.-* (i) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2023 අගෝස්තු මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදි.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 සැප්තැම්බර් මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 15 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

909- B 824791— 5,403 (2023/09)

# පළාත් පාලන නිවේදන

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

1975 අංක 4 වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියට අනුව මාර්ග නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. 1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනතේ විධිවිධාන පරිදි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග සඳහා මාර්ග නාමයන් ප්‍රකාශයට පත්කරන ලද බව මෙයින් දන්වමි.

ඩබ්ලිව්. ඒ. අජිත් කිත්සිරි,
ලේකම් හා සභාවේ බලතල, කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2023 අගෝස්තු මස 24 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

**මාර්ග නාමලේඛනය - 2023**

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

| *පැරණි මාර්ග නාමය* | *භාවිතා කළ යුතු නාමය* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* |
|---|---|---|---|
| - | සණස මාවත | පොල්ගම්පල කුම්බදූව ප්‍රධාන මාර්ගයේ කුරුඳුවත්ත ප්‍රදේශයෙන් | සණස ගොඩනැගිල්ල වටෙන් ගොස් |
| පොල්වත්තවෙල සාදගොඩ මාර්ගය | ඞී. ඊ. කොතලාවල මාවත | පොල්වත්තවෙල රත්මලේ මාර්ග යේ අනුර කොතලාවල මහතාගේ නිවස අසලින් | |

09-107

# විවිධ දැන්වීම්

## සංශෝධනයයි

### කඩුවෙල මහා නගර සභාව

2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

2022.11.18 දින පළ වූ අංක 2307 *ගැසට්* පත්‍රයේ 11-23/7 නිවේදනයේ විවිධ ගාස්තු යටතේ අනු අංක LVI යටතේ සඳහන් වූ කරුණු හා නිවේදන ද, සනීපාරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් වන නව යෝජනාව ද මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්රුක්ෂි ගමගේ,
නාගරික කොමසාරිස් සහ බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරී,
කඩුවෙල මහා නගර සභාව.

2023 අගෝස්තු මස 16 වැනි දින,
කඩුවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**කඩුවෙල මහා නගර සභාව**

**2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම**

කඩුවෙල මහා නගර සභාව විසින් 2023 අගෝස්තු මස 04 වැනි දින පවත්වනු ලැබූ පරිපාලන කමිටු රැස්වීමේ දී අයිතම අංක 2023/01/ප/තීරණ අංක 327 හා 2023/01/ප/තීරණ අංක 348 යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිල්රුක්ෂි ගමගේ,
නාගරික කොමසාරිස් සහ බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කරන නිලධාරී,
කඩුවෙල මහා නගර සභාව.

2023 අගෝස්තු මස 16 වැනි දින,
කඩුවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම**

| | *සේවාව* | *2023 වර්ෂය සඳහා වන ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | කඩුවෙල බස් නැවතුම්පොළ, පොදු වෙළඳපොළ හා කඩුවෙල සතිපොළෙ හි සනීපාරක්ෂක කටයුතු වැසිකිළි භාවිතය<br>(අ) එක් අයෙකු සඳහා | 25 0 |
| | (ආ) සනීපාරක්ෂක සේවා කටයුතු සැපයීම සඳහා වන තැන්පත් මුදල | 05 0 |
| | කොම්පෝස්ට් පොහොර :<br>1. ඇසුරුම් නොකරන කිලෝ ග්‍රෑම් 01ක් සඳහා | 10 0 |
| | 2. ඇසුරුම් කරන ලද - කිලෝ ග්‍රෑම් 02ක් (පැකට් 01 ක් සඳහා) | 40 0 |
| | 3. ඇසුරුම් කරන ලද - කිලෝ ග්‍රෑම් 05ක් (පැකට් 01 ක් සඳහා) | 100 0 |
| | 4. ඇසුරුම් කරන ලද - කිලෝ ග්‍රෑම් 10ක් (පැකට් 01 ක් සඳහා) | 200 0 |
| | 5. ඇසුරුම් කරන ලද - කිලෝ ග්‍රෑම් 20ක් (පැකට් 01 ක් සඳහා) | 400 0 |
| | 6. ඇසුරුම් කරන ලද - කිලෝ ග්‍රෑම් 50ක් (පැකට් 01 ක් සඳහා) | 1,000 0 |
| | 7. ඇසුරුම් කරන ලද පොහොර අලෙවි මධ්‍යස්ථාන සඳහා (කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා) | 20 0 |

09-154

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.